පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **10**

# දෙවන වාර පරීක්ෂණය - 2019

විෂයය **බුද්ධ ධර්මය I,II**

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................
..................................................

කාලය : පැය **03** යි.

## I පත්‍රය

- **පහත සඳහන් ප්‍රශ්නවලට ගැළපෙන හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බෝසතුන්ගේ අනුපමේය රූපශ්‍රීය වර්ණනා කරමින් නිබ්බුත පද ප්‍රකාශ කළේ,
(1) යශෝදරාව යි. (2) කිසාගෝතමිය යි.
(3) පටාචාරාව යි. (4) විශාඛාව යි.

02. බෝසතාණන් වහන්සේ මුහුණ දුන් අභියෝග ජය ගැනීමට ඉවහල් නොවූ කරුණ වන්නේ,
(1) ඉවසීම යි. (2) අධිෂ්ඨානය යි.
(3) නිවැරදි තීරණ නොගැනීම යි. (4) කැපවීම යි.

03. මහා සංසරත්නය මනාවූ පිළිවෙත් පුරන නිසා,
(1) සුපටිපන්න නම් වේ. (2) ඤායපටිපන්න නම් වේ.
(3) උජුපටිපන්න නම් වේ. (4) පාහුනෙය්‍ය නම් වේ.

04. තෙරුවන් ගුණ ගණන වන්නේ,
(1) නවය කි. (2) දාසය කි. (3) විසිතුන කි. (4) විසිහතර කි.

05. සිත වැඩි දියුණු කිරීම සඳහා වැඩිය යුතු භාවනාව වන්නේ,
(1) විදර්ශනා භාවනාව යි. (2) සමථ භාවනාව යි.
(3) ත්‍රිලක්ෂණ භාවනාව යි. (4) මේ කිසිවක් නොවේ.

06. ගමේ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ විසින් ගරාවැටී තිබුණු දාගැබ ප්‍රතිසංස්කරණය කොට වැඳුම් පිදුම් කිරීමට සුදුසු ස්ථානයක් බවට පත් කරන ලදී. මෙය උන් වහන්සේගෙන් සිදු වූ,
(1) ජාතික සේවාව කි. (2) සාමාජයීය සේවාව කි.
(3) ආගමික සේවාව කි. (4) සංස්කෘතික සේවාව කි.

07. පංච ඉන්ද්‍රියන්වලට අයත් නොවන්නේ,
(1) මනස යි. (2) ඇස යි. (3) ශරීරය යි. (4) දිව යි.

08. සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමුවන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) සිල්වත් වීම යි. (2) බණ ඇසීම යි.
(3) ඉන්ද්‍රිය සංවරය යි. (4) කල්‍යාණ මිත්‍ර ඇසුර යි.

09. පංච ඉන්ද්‍රියන් තුළින් අරමුණු ලබාගෙන තම සිතෙහි ඇතිවන වින්දනය හඳුන්වන්නේ,
(1) රූප ස්කන්ධය නමිනි. (2) වේදනා ස්කන්ධය නමිනි.
(3) සඤ්ඤා ස්කන්ධය නමිනි. (4) සංඛාර ස්කන්ධය නමිනි.

10. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමිපාණන් වහන්සේ විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථයක් නොවන්නේ,
(1) මුණිගුණාලංකාරය යි. (2) සතර බණවර සන්නය යි.
(3) සාරාර්ථ සංග්‍රහය යි. (4) අභිධර්ම මාර්ගය යි.

11. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය." මෙම ප්‍රකාශය කළේ,
(1) දුටුගැමුණු රජතුමා ය. (2) වළගම්බා රජතුමා ය.
(3) මහසෙන් රජතුමා ය. (4) පරාක්‍රමබාහු රජතුමා ය.

12. සිංහල බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදයට අයත් ගාථා ගණන වන්නේ,
(1) 223 කි. (2) 423 කි. (3) 424 කි. (4) 323 කි.

13. සීලය සම්පූර්ණ වීම සඳහා තිබිය යුත්තේ,
(1) භාවනාව යි. (2) හිරි සහ ඔත්තප්පය යි.
(3) විරමණය හා සමාදානය යි. (4) තමා උපමා කොට අන්‍යයන් ගැන සිතීම යි.

Education NCP - www.edncp.lk

14. පුද්ගලයා විසින් උපයාගත් ධනය විනාශයට හේතුවන කරුණු හයක් පිළිබඳ දැක්වෙන සූත්‍ර දේශනාව වන්නේ,
(1) මහා මංගල සූත්‍රය යි. (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
(3) පරාභව සූත්‍රය යි. (4) සිගාලෝවාද සූත්‍රය යි.

15. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසා නමස්කාරයේ උතුරු දිසාවෙන් දැක්වෙන්නේ,
(1) මවු පියන් ය. (2) ගුරුවරුන් ය.
(3) පැවිදි උතුමන් ය. (4) හිත මිතුරන් ය.

16. දෙමව්පියන් තුළ පවතින සතර බ්‍රහ්ම විහරණවලට අයත් නොවන්නේ,
(1) සමානාත්මතාව යි. (2) මෙත්තාව යි.
(3) මුදිතාව යි. (4) කරුණාව යි.

17. භික්ෂූන් වහන්සේලාගේ පහසුව සඳහා ගිහියන් විසින් ලබා දෙන සිව්පසය වන්නේ,
(1) චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලන්පස යි. (2) චීවර, සේනාසන, ගිලන්පස හා ආරාම යි.
(3) ගිලන්පස, චීවර, සේනාසන හා පිරිකර යි. (4) චීවර, පිණ්ඩපාත, සේනාසන හා දානය යි.

18. සමාජයේ අන්‍යොන්‍ය වශයෙන් යුතුකම් ඉටු වීමෙන්,
(1) පුද්ගල දියුණුව හා සමාජ දියුණුව ඇති වේ. (2) පුද්ගල දියුණුව හා සමාජ පරිහානිය ඇති වේ.
(3) පුද්ගල පරිහානිය හා සමාජ දියුණුව ඇති වේ. (4) තමාගේ යුතුකම් බිඳ වැටේ.

19. බුදුරජාණන් වහන්සේ තම පද්මාකාර ජීවිතය පිළිබඳ පැහැදිලි කළේ,
(1) පොට්ඨපාද පිරිවැජියාට ය. (2) සෝණදණ්ඩ බමුණාට ය.
(3) ද්‍රෝණ බමුණාට ය. (4) සකුළුදායි පිරිවැජියාට ය.

20. 'ජලයේ පාසි ඇත්නම් එහි කිසිවක් නොපෙනේ'. පංච නීවරණ ධර්මවල **පාසි සහිත ජලය** උපමාකර ඇත්තේ,
(1) කාමච්ඡන්දයට ය. (2) විචිකිච්ඡාවට ය.
(3) ව්‍යාපාදයට ය. (4) ථීනමිද්ධයට ය.

21. වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කිරීම පිළිබඳ දැක්වෙන ධම්මපද ගාථාව වන්නේ,
(1) 'උට්ඨානවතෝ සතිමතෝ..........' යන ගාථාවයි.
(2) 'සුසුඛංවත ජීවාම ....... ' යන ගාථාවයි.
(3) 'සබ්බේ තසන්ති දණ්ඩස්ස ........' යන ගාථාවයි.
(4) 'අචරිත්වා බ්‍රහ්ම චරියං .....' යන ගාථාවයි.

22. බහුජාතික, බහු ආගමික සමාජයක ජීවත්වීමේ දී අප විසින් වඩාත් ඇති කර ගත යුතු වන්නේ,
(1) සමානාත්මතාව යි. (2) සහජීවනය යි.
(3) සමාදානය යි. (4) විරුද්ධ නොවීම යි.

23. ජාතික හා ආගමික වශයෙන් පොදුවේ මිනිසාට මුහුණදීමට සිදුවන ධර්මතාවක් නොවන්නේ,
(1) චතුරාර්ය සත්‍යය යි. (2) පටිච්චසමුප්පාදය යි.
(3) ත්‍රි ලක්ෂණය යි. (4) සතර සංග්‍රහ වස්තුව යි.

24. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරේ වැඩ සිටිය දී කර්ම හා කර්ම විපාක පිළිබඳ උන්වහන්සේගෙන් විමසා සිටියේ,
(1) සිගාල තරුණයා ය. (2) සුභ තරුණයා ය.
(3) ද්‍රෝණ බමුණා ය. (4) කොසොල් රජතුමා ය.

25. සෝවාන් ආදී මාර්ග ඵල උපදවා ගැනීමට බලපාන බලවත් කුසල කර්මය වන්නේ,
(1) ආසන්න කර්මය යි. (2) ආචිණ්ණ කර්මය යි.
(3) ගරුක කර්මය යි. (4) කටත්තා කර්මය යි.

26. කර්මය සඳහා හේතුවන චේතනා අතුරින් කුසල චේතනාව වන්නේ,
(1) ලෝභය යි. (2) අලෝභය යි.
(3) දෝසය යි. (4) මෝහය යි.

27. 'අනිච්චාවත සංඛාරා.......' යන ගාථාව අයත් සූත්‍ර දේශනාව වන්නේ,
(1) මහා පරිනිබ්බාන සූත්‍රය යි. (2) මහා මංගල සූත්‍රය යි.
(3) කරණීය මෙත්ත සූත්‍රය යි. (4) වසල සූත්‍රය යි.

28. පුද්ගලයෙකු උත්පත්තියේ සිට මියයන මොහොත තෙක් විඳින සියලු දුක් ත්‍රිලක්ෂණ ධර්මයේ සඳහන් වේ. එය අයත් වන්නේ,
(1) කර්ම ලක්ෂණයට යි. (2) අනාත්ම ලක්ෂණයට යි.
(3) අනිත්‍ය ලක්ෂණයට යි. (4) දුක්ඛ ලක්ෂණයට යි.

29. උපතිස්ස පිරිවැජියාගේ මුල් ගුරුවරයා වන්නේ,
(1) අස්සජි පිරිවැජියා ය. (2) සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ය.
(3) සංජය පිරිවැජියා ය. (4) වංකි බමුණා ය.

Education NCP - www.ncp.lk

30. 'යේ ධම්මා හේතුප්පභවා.......' යන ගාථාව අස්සජි හිමියන් විසින් දේශනා කළේ,
(1) කෝලිත පිරිවැජියාට ය. (2) උපතිස්ස පිරිවැජියාට ය.
(3) සංජය පිරිවැජියාට ය. (4) උපාලි ගෘහපතියාට ය.

31. බුදුවරයෙකු ලොව පහළවන්නේ උත්තරීතර පරම සත්‍යය මිනිස් වර්ගයාට දේශනා කිරීමට ය. එම පරම සත්‍ය වන්නේ,
(1) සිව්සස් දහම යි. (2) පංච සීලය යි.
(3) සිව් බඹ විහරණ යි. (4) කර්මය යි.

32. සමාජයේ දිළිඳුකම නිසා සොරකම ද, සොරකම නිසා අවි ආයුධ භාවිතය ද වැඩිවීම ආදි බොහෝ සමාජ ගැටලු ඇතිවේ. බුදු දහම අනුව මෙය සිදුවන්නේ,
(1) පටිච්චසමුප්පාදයට අනුව ය. (2) අටලෝදහමට අනුව ය.
(3) කර්ම විපාකවලට අනුව ය. (4) අහේතුකව ය.

33. දුක්ඛ ආර්ය සත්‍යයේ ඇතිවීම්, නැතිවීම් හේතුවෙන් හටගන්නා දුක දක්වා ඇත්තේ,
(1) දුක්ඛ දුක්ඛ නමිනි. (2) විපරිනාම දුක්ඛ නමිනි.
(3) ජරා දුක්ඛ නමිනි. (4) සංඛාර දුක්ඛ නමිනි.

34. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාවට අයත් අංගයක් නොවන්නේ,
(1) සම්මා වාචා ය. (2) සම්මා වායාම ය.
(3) සම්මා ආජීව ය. (4) සම්මා කම්මන්තය ය.

35. පස්කම් සැපතින් නික්මීම සම්මා සංකප්පයෙහි සඳහන් වන්නේ,
(1) නෙක්ඛම්ම සංකප්ප නමිනි. (2) අවිහිංසා සංකප්ප නමිනි.
(3) අව්‍යාපාද සංකප්ප නමිනි. (4) ව්‍යාපාද සංකප්ප නමිනි.

36. බුදුරජාණන් වහන්සේ හයවන (06) වස් කාලය ගත කරන ලද්දේ,
(1) භේෂකලා පර්වතයෙහි ය. (2) විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි ය.
(3) මකුල පර්වතයෙහි ය. (4) චාලිය පර්වතයෙහි ය.

37. ඉච්ඡානංගල වනයෙහි වැඩ සිටියදී බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර දේශනාව වන්නේ,
(1) තේවිජ්ජ සූත්‍රය යි. (2) අම්බට්ඨ සූත්‍රය යි.
(3) වේදනාපරිග්ගහ සූත්‍රය යි. (4) මහා සිංසපා සූත්‍රය යි.

38. වර්තමානයේ මිනිසාට නියඟය, අධික පරිසර උෂ්ණත්වය, සුළි සුළං ගංවතුර වැනි ස්වභාවික විපත්වලට මුහුණ දීමට සිදු වී තිබේ. මේවා ඇතිවීමට බලපාන ප්‍රධාන හේතුවක් නොවන්නේ,
(1) වනාන්තර විනාශ කිරීම යි. (2) පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම යි.
(3) මිනිසා කාර්මීකරණයට යොමු වීමයි. (4) පරිසර සංරක්ෂණය කිරීම යි.

39. සතර මහා භූතයන් අතරින් ''වායෝ '' ලෙස දැක්වෙන්නේ,
(1) සෙලවෙන ස්වභාවය යි. (2) තද ස්වභාවය යි.
(3) වැගිරෙන ස්වභාවය යි. (4) උෂ්ණ හා සීතල ස්වභාවය යි.

40. පස්වග මහණුන් හට ත්‍රිලක්ෂණ ධර්මය පිළිබඳව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍රය වන්නේ,
(1) අනන්ත ලක්ඛණ සූත්‍රය යි. (2) දම්සක් පැවතුම් සූත්‍රය යි.
(3) මහා පරිනිබ්බාන සූත්‍රය යි. (4) මහා මංගල සූත්‍රය යි.

(ලකුණු 1×40=40)

Education NCP- www.edncp.lk

# II පත්‍රය

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

01.

i. පංච මහා විලෝකනයෙන් **දෙකක්** නම් කරන්න.
ii. ධර්ම රත්නයේ ගුණ අතරින් **දෙකක්** ලියා දක්වන්න.
iii. **'චිත්තං සමේතීති සමථෝ'** යන පාඨයේ අර්ථය දක්වන්න.
iv. දුටුගැමුණු මහ රජතුමා විසින් ඉදිකරන ලද ආගමික ස්ථාන **දෙකක්** නම් කරන්න.
v. සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස **දෙකක්** ලියන්න.
vi. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන දරුවන් විසින් දෙමව්පියන් වෙත ඉටු කළ යුතු යුතුකම්වලින් **දෙකක්** ලියන්න.
vii. විපාක දෙන ආකාරය අනුව කර්ම සතර ආකාරය. එයින් **දෙකක්** නම් කරන්න.
viii. 'අමා දහර දිය ගලා ගලා ....' යන ගීතය ගායනා කළ ගායකයාගේ නම ලියන්න.
ix. ත්‍රිවිධ තෘෂ්ණාවෙන් **දෙකක්** ලියන්න.
x. සිදුහත් කුමරු ප්‍රගුණ කළ **ශිල්ප දෙකක්** නම් කරන්න. (ලකුණු 2x10=20)

02.

i. සිදුහත් බෝසතාණන් වහන්සේ අභියෝග ජයගත් අවස්ථා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
ii. ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
iii. ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට මුහුණදීමට සිදුවන අභියෝග ජයගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

03.

i. පුද්ගලයාගේ යසස හා කීර්තිය වැඩීමට හේතුවන කරුණු ඇතුළත් ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 02)
ii. එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03)
iii. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ධම්මපදය කොතෙක් දුරට උපකාරී වන්නේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

04.

i. බෞද්ධ භාවනාවේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02)
ii. ඉන් **එකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
iii. බෞද්ධ භාවනාව ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා උපකාරීවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

05.

i. බෞද්ධ විමුක්ති මාර්ගයේදී අත්හල යුතු **අන්ත දෙක** නම් කරන්න. (ලකුණු 02)
ii. දුක්ඛ ආර්ය සත්‍යයේ දැක්වෙන අටවැදෑරුම් දුක් අතරින් **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 03)
iii. එදිනෙදා ජීවිතයේදී මුහුණදීමට සිදුවන ගැටළු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය ඉවහල් කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

06.

i. පරිසරය බෙදිය හැකි ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02)
ii. බුදු සිරිත හා පරිසරය අතර පැවති සබඳතාව දැක්වීමට නිදසුන් **තුනක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 03)
iii. වර්තමාන සමාජයේ මිනිසා විසින් පරිසරයට සිදු කරන අහිතකර බලපෑම කෙබඳු දැයි විස්තර කරන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකාවලින් **දෙකකට** කෙටි සටහන් ලියන්න

i. දුටුගැමුණු මහ රජතුමා (ලකුණු 05)
ii. ආර්ය අෂ්ටාංගික මාර්ගය (ලකුණු 05)
iii. සිගාලෝවාද සූත්‍රයේ ගුරු සිසු සබඳතාව (ලකුණු 05)
iv. සහජීවනය (ලකුණු 05)

* * *

Education NCP - www.edncp.lk

# දෙවන වාර පරීක්ෂණය - 2019
# බුද්ධ ධර්මය - 1
# 10 ශ්‍රේණිය

1. (3) - කිසාගෝතමියයි
2. (3) - නිවැරදි තීරණ නොගැනීමයි
3. (1) - සුපටිපන්න නම් වෙයි
4. (4) - 24යි
5. (2) - සමථ භාවනාවයි
6. (3) - ආගමික සේවාවකි
7. (1) - මනසයි
8. (3) - ඉන්ද්‍රිය සංවරයයි
9. (2) - වේදනා ස්කන්ධයයි
10. (4) - අභිධර්ම මාර්ගයයි
11. (1) - දුටුගැමුණු රජතුමාය
12. (2) - හාරසිය විසිතුනකි
13. (3) - විරමණය හා සමාදානයයි
14. (4) - සිගාලෝවාද සූත්‍රයයි
15. (4) - සිත මිතුරන් ය
16. (1) - සමානාත්මතාවයි
17. (1) - චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පසයි
18. (1) - පුද්ගල දියුණුව හා සමාජ දියුණුව ඇතිවීමයි
19. (3) - ද්‍රෝණ බමුණාට ය
20. (4) - ථීනමිද්ධයටය
21. (2) - සුසුබංවත ජීවාම ගාථාවයි
22. (1) - සහජීවනයයි
23. (4) - සතර සංග්‍රහ වස්තුවයි
24. (2) - සුභ තරුණයාය
25. (3) - ගරුක කර්මයයි
26. (3) - අලෝභයයි
27. (1) - මහා පරිනිබ්බාන සූත්‍රයයි
28. (4) - දුක්ඛ ලක්ෂණයයි
29. (3) - සංජය පිරිවැජියාය
30. (3) - උපතිස්ස පිරිවැජියාටය
31. (1) - සිව්සස් දහමය
32. (1) - පටිච්ච සමුප්පාදයට අනුවය
33. (4) - සංඛාර දුක්ඛතා නමිනි
34. (2) - සම්මා වායාමය
35. (1) - නෙක්ඛම්ම සංකප්ප ලෙසිනි
36. (3) - මකුල පර්වතයෙහි ය
37. (2) - අම්බට්ඨ සූත්‍රය
38. (4) - පරිසරය සංරක්ෂණය කිරීමයි
39. (1) - සෙලවෙන ස්වභාවයයි
40. (1) - අනත්ත ලක්ඛණ සූත්‍රයයි

## II කොටස

1.

i. කාලය, දීපය, දේශය, කුලය, මව

ii. ස්වාක්ඛාතෝ, සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වේදිතබ්බෝ

iii. සිත සන්සුන් කරන්නේ සමථයයි

iv. මිරිසවැටිය, ලෝවාමහාපාය, රුවන්වැලිමහාසෑය

v. මහත් වූ බෝග සම්පත් ලැබීම
කීර්තිය පැතිරීම
ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළැඹිය හැකිවීම
සිහිමුලා නොවී කලුරිය කිරීම
මරණින් මතු සුගතියෙහි ඉපදීම

vi. මව්පියන් පෝෂණය කිරීම
ඔවුන්ගේ කටයුතු ඉටු කර දීම
දෙමාපියන් රැකගෙන ආ කුලපරපුර ආරක්ෂා කිරීම
දෙමාපියන්ගෙන් හිමි වූ දේ ආරක්‍ෂා කිරීම
දෙමාපියන් පරලොව ගිය පසු පිං අනුමෝදන් කිරීම

vii. ගරුක කර්මය, ආසන්න කර්මය, ආචිණ්ණ කර්මය, කටත්තා කර්මය

viii. විශාරද වික්ටර් රත්නායක මහතා

ix. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා

x. කඩු ශිල්ප, දුනු ශිල්ප, රථ ශිල්ප, ඇතුන් අසුන් හැසිරවීම

2.

i. සිදුහත් උපත, ශිල්ප හැදෑරීම, සතර පෙර නිමිති දැකීම, නිබ්බුත පද ඇසීම, අභිනිෂ්ක්‍රමණය කිරීම, රජුගේ අපේක්‍ෂා ඉටු කිරීම ආදි කරුණු වලින් 02ක්

ii. නම් කර ඇති අවස්ථාවලින් එක් අවස්ථාවක් විස්තර කර ඇති ආකාරය සලකා ලකුණු ලබාදෙන්න (පළමු පාඩමේ පිටු 1-4 දක්වා පිටු)

iii. සමස්ත පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න (01 පාඩම)

3.

i. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්මජීවිනෝ - අප්පමත්තස්ස යසෝභිවඩ්ඩති

ii. උත්සාහය මනා සිහිය විමසා බලා කටයුතු කරන පිරිසිදු ක්‍රියා ඇති, හික්මුණු, දැහැමිව ජීවත්වන අප්පමාදි පුද්ගලයාගේ යසස වැඩේ

iii. සමස්ථය සලකා ලකුණු ලබා දෙන්න. (07 පාඩම)

4.

i. සමථ භාවනාව හා විදර්ශනා භාවනාව

ii. එක් භාවනා ක්‍රමයක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න (04,05 පාඩම බලන්න)

iii. සමස්ථය සලකා ලකුණු ලබා දෙන්න. (07 පාඩම)

5.

i. අත්තකිලමථානු යෝගය හා කාමසුඛල්ලියකානු යෝගය

ii. 15 පාඩමේ 83 පිටුවේ 02 ඡේදය බලා ලකුණු ලබාදෙන්න.

iii. (15 පාඩම) සමස්ථ පාඩම බලා ලකුණු ලබා දෙන්න.

6.

i. ජීවි පරිසරය, අජීවී පරිසරය

ii. 16 පාඩම බලා ලකුණු ලබාදෙන්න

iii. සමස්ථය සලකා බලා ලකුණු ලබා දෙන්න. (16 පාඩම)

7.

i. 06 පාඩම පිටු අංක 37

ii. 15 පාඩම පිටු අංක 85,86

iii. 09 පාඩම පිටු අංක 52

iv. 11 පාඩම පිටු අංක 62


අදාළ පිළිතුර ලබාදී ඇත්නම් ලකුණු ලබා දෙන්න.


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පොත් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371







































# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

